සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

13 ශ්‍රේණිය - තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - Grade 13 - 2025

කෘෂි විද්‍යාව I
Agri Science I

08 S I

පැය දෙකයි
Two Hours

නම / විභාග අංකය: ....

උපදෙස්,
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- 1 - 50 තෙක් එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4, 5 යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න. එය උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (x) යොදා දක්වන්න.
- ගණක යන්ත්‍ර භාවිතයට ඉඩදෙනු නොලැබේ.

01) අතීත ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සශ්‍රීකත්වයට දේශීය තාක්ෂණය ඉවහල් වූ ආකාරය පිළිබඳ උදාහරණයක් නොවන්නේ,
1. ප්‍රදේශයෙන් ප්‍රදේශයට විශේෂිකරණය වූ උපකරණ
2. රෝපණ ද්‍රව්‍ය තමන් විසින්ම සකසා ගැනීම
3. පරිසර හිතකාමී පළිබෝධ පාලන ක්‍රම
4. දියුණු කෘෂි ව්‍යාප්ති සේවය
5. කාල හෝරා අනුව වගා කිරීම

02) කෘෂි කාලගුණ මධ්‍යස්ථානයක තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමාන පාඨාංක
1. පෙ.ව. 8.30 ට පමණක් ලබා ගනී
2. ප.ව. 3.30ට පමණක් ලබාගනී
3. පෙ.ව. 8.30 ට හා ප.ව. 3.30 ට ලබා ගනී
4. පෙ.ව. 8.30 හා ප.ව. 3.30 අතර කාලයේදී එක්වරක් ලබාගනී
5. පෙ.ව. 8.30 හා ප.ව. 3.30 අතර කාලයේදී දෙවරක් ලබාගනී

03) වාර්ෂික වර්ෂාපතනය 2500mm ට වැඩි උච්චත්වය 300mට අඩු ප්‍රදේශයක පිහිටි කෘෂි පාරිසරික කලාපයක් විය හැක්කේ,
1. WU_1 2. IU_2 3. DL_1a 4. IM_1a 5. WL_1a

04) පාෂාණවල රසායනික ජීර්ණය සිදුවන අවස්ථාවකට උදාහරණ වන්නේ,
1. උෂ්ණත්ව විචලනය නිසා පාෂාණවල ඇති ඛනිජ ප්‍රසාරණය හා සංකෝචනය වීම
2. පාෂාණවල ඛනිජ කාබනික අම්ලවල දියවීම
3. සුළං නිසා පාෂාණ එකිනෙක ගැටී කැඩී යාම
4. ශාක මුල් ගමන් කිරීමෙන් පාෂාණ පුපුරා යෑම
5. මිනිස් අවශ්‍යතා සඳහා කළුගල් කැඩීම

05) ද්විතියික ඛනිජ
1. ආග්නේය පාෂාණ ජීර්ණයෙන් පසට ලැබේ
2. පසේ වැලි කොටසේ බහුලව අන්තර්ගත වේ
3. සිලිකා හා ඇලුමිනා ස්ථිර ලෙස සෑදී ඇත
4. පසේ වඩාත් අක්‍රියම කොටස වේ
5. ක්වෝට්ස් සහ ෆෙල්ස්පාර් මේ සඳහා උදාහරණය

06) විචලනය වන භූගත ජල මට්ටම හා උපකරණ හෝ සතුන් නිසා පස තද වීම මගින් පසේ සෑදිය හැකි ව්‍යුහ ආකාරය වන්නේ,
1. කුට්ටිමය හැඩති ව්‍යුහ
2. ස්ථම්භික හැඩති ව්‍යුහ
3. කණිකාමය හැඩති ව්‍යුහ
4. ප්‍රිස්මාකාර හැඩති ව්‍යුහ
5. තැටි ආකාර හැඩති ව්‍යුහ

07) ලවණ සහිත පසක බෝග වගාවේදී ඇති ප්‍රධාන ගැටළුව වන්නේ,
1. Al^{3+}, Fe^{2+}, Fe^{3+} අයනවල විෂ තත්ත්ව ඇතිවීම
2. ශාක මුල්වල බාහිර ආසූතිය සිදුවීම නිසා ශාක මිය යෑම
3. Ca^{2+}, Mg^{2+}, K^{+} අයන ඌනතා නිතර ඇතිවීම
4. ව්‍යාධිජනක දිලීර ඉක්මණින් වර්ධනය වීම
5. පසේ හිතකර බැක්ටීරියා ක්‍රියාකාරීත්වය වැඩිවීම

ALapiedu.com
Scanned with CamScanner

08) භූමි භාවිත වර්ගීකරණයට අනුව පස සංරක්ෂණ ක්‍රම යෙදීමේදී 1, 2, 3 යන භූමි පන්ති සඳහා



1. කෘෂිකාර්මික පාංශු සංරක්ෂණ ක්‍රම යොදා ගනිමින් වගාකළ හැක
2. කෘෂිකාර්මික ක්‍රම සමග යාන්ත්‍රික පාංශු සංරක්ෂණ ක්‍රම භාවිතා කළ යුතුය
3. යාන්ත්‍රික පාංශු සංරක්ෂණ ක්‍රම යොදා ගනිමින් වගා කළ යුතුය
4. යාන්ත්‍රික පාංශු සංරක්ෂණ ක්‍රම සමග ජෛව විද්‍යාත්මක පාංශු සංරක්ෂණ ක්‍රම භාවිත කළ යුතුය
5. වනජ ශාක වගා කරමින් පාංශු සංරක්ෂණය කර ගත යුතුය.

09) තම වගා ක්ෂේත්‍රය නිරීක්ෂණය කළ ගොවි මහතෙකුට ශාක කිහිපයක පහත ඌනතා ලක්ෂණ දක්නට ලැබුණි

A - පරිනත පත්‍ර දාර කහ පැහැවී පසුව ක්‍රමයෙන් දුඹුරු පැහැවී පිළිස්සුණු ස්වභාවයක් ගැනීම.
B - පරිනත පත්‍රවල අන්තර් නාරටි හරිතක්ෂය දක්නට ලැබීම
C - ළපටි පත්‍ර කහ පැහැවී නාරටි තද කොළ පැහැති දැලක් සේ දිස්වීම

මෙම ඌණතාවලට හේතුවිය හැකි පෝෂක පිළිවෙළින්

1. පොස්පරස්, මැග්නීසියම්, කැල්සියම්
2. පොටෑසියම්, මැග්නීසියම්, යකඩ
3. නයිට්‍රජන්, සල්ෆර්, කැල්සියම්
4. පොටෑසියම්, කැල්සියම්, යකඩ
5. පොස්පරස්, සල්ෆර්, යකඩ

10) පසක පොහොර භාවිත කාර්යක්ෂමතාවය සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහතින් දක්වා ඇත.

A - පසක් ක්ෂේත්‍රධාරිතාවේ පවතින විට පොහොර භාවිත කාර්යක්ෂමතාව උපරිම වේ.
B - ජලවහනය දුර්වල පසක N පොහොරවල NO_3 නයිට්‍රිහරණය නිසා අපතේ යා හැක.
C - උණුසුම් කාලගුණ තත්ත්ව යටතේ ඇමෝනියා හා යූරියා පස සමග මිශ්‍ර කිරීමෙන් පොහොර කාර්යක්ෂමතාව වැඩි කර ගත හැක.

මින් නිවැරදි වන්නේ,

1. A පමණි 2. A හා B 3. B හා C 4. A හා C 5. ABC සියල්ලම

11) පොස්පරස් මූල ද්‍රව්‍යයේ ද්‍රාව්‍යතාව වැඩි කරන ජෛව පොහොර සෑදීමට භාවිතා කරන බැක්ටීරියාවක් වන්නේ,

1. Rhizobium 2. Psuedomonas 3. Aspergillus 4. Penicillium 5. AM fungi

12) බිම් සැකසීමේදී යොදා ගන්නා උපකරණයක රූප සටහනක් පහත දැක්වේ.



උපකරණය සම්බන්ධව සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1. කැටපොඩිකිරීම, පස බුරුල් කිරීම වැනි කාර්යයන් සඳහා යොදා ගනී
2. ගල් මුල් සහිත පසක බිම් සැකසීමට යෝග්‍ය නොවේ.
3. සිව්රෝද ට්‍රැක්ටරයට සම්බන්ධ කරයි
4. ප්‍රාථමික බිම් සැකසීමට භාවිතා නොකරයි
5. ගොඩ ගොවිතැනේදී බහුලව භාවිතා කරයි

ALapiedu.com

Scanned with CamScanner

13) ද්විතියික බිම් සැකසීම හේතුවෙන් පසේ සිදුවිය හැකි වෙනස්කමක් වන්නේ,

1. පසේ දෘශ්‍ය ඝනත්වය වැඩිවීමයි.
2. පසේ කැටායන හුවමාරු ධාරිතාව අඩුවීමයි.
3. පසේ සත්‍ය ඝනත්වය වැඩිවීමයි.
4. පසේ සච්ඡිද්‍රතාව අඩුවීමයි.
5. පසේ වාතනය වැඩි දියුණු වීමයි.

14) බෝග වගා ක්ෂේත්‍රයක වාෂ්පීකරණ උත්ස්වේදන වේගය දිනකට 6mm ක් ද, ක්ෂේත්‍ර ධාරිතාවේ පසේ තෙතමනය 48mm ක් ද, නම් මෙම වගා ක්ෂේත්‍රයට සුදුසු ජල සම්පාදන කාලාන්තරය වනුයේ

1. දින 3 කි 2. දින 4 කි 3. දින 6 කි 4. දින 8 කි 5. දින 12 කි

15) ජල සම්පාදන ක්‍රමයක් ලෙස විසිරි ජල සම්පාදනයේ ප්‍රධාන ගැටළුවක් වන්නේ,

1. ජලය වැඩි ප්‍රමාණයක් අපතේ යැම
2. මතුපිට අපධාවය වැඩිවීම නිසා පාංශු ඛාදනය වැඩිවීම
3. අධික සුළං සහිත ප්‍රදේශවල භාවිතය අපහසු වීම
4. ක්ෂේත්‍රයේ අතුරු බෝග වගා කිරීම අපහසු වීම
5. ජලය කාන්දුවීම අධික වැලි පස් සඳහා නුසුදුසු වීම

16) වියළි කලාපයේ කෝපි, අඹ, පොල් වැනි ශාක වල පැළ අවධියේදී ජල සම්පාදනය සඳහා යෝග්‍ය ජල සම්පාදන ක්‍රමයක් වන්නේ,

1. ඇලි හා වැටි ක්‍රමයයි
2. තීරු ජල සම්පාදනයයි
3. සච්ඡිද්‍ර නල භාවිතා කිරීමයි
4. මැටි බඳුන් මගින් ජල සම්පාදනයයි
5. විසිරි ජල සම්පාදනයයි

17) කෘෂිකර්මාන්තයේ ශාක වර්ධක යාමක ප්‍රායෝගිකව භාවිතා කරන අවස්ථාවක් නොවන්නේ

1. ඵල ඉදීම වේගවත් කර ගැනීමට
2. ඵල හා පත්‍ර විශාල කිරීම
3. වල් නාශක ලෙස
4. බීජ සුප්තතාවය ඉවත් කිරීමට
5. ශාක බද්ධ කිරීමේ ක්‍රියාවලියට

18) ශාකයේ වර්ධනය නිරීක්ෂණය සඳහා විවිධ පරාමිතීන් වැදගත් වේ. ශාක වර්ධන පරාමිතියක් සඳහා උදාහරණයක් නොවන්නේ,

1. පත්‍ර ක්ෂේත්‍රඵලය 2. ශාකයේ පරිධිය 3. ශාකයේ වියළිබර
4. ශාකයේ උස 5. ශාක කඳේ විෂ්කම්භය

19) වී, බඩඉරිඟු, පොල් ආදි බීජවල

1. පැහැදිලිව හඳුනාගතහැකි බීජ පත්‍ර 2ක් ඇත
2. සංචිත ආහාර මාංශල බීජ පත්‍රවල තැන්පත්ව ඇත
3. ඵලාවරණය බීජාවරණය සමඟ තදින් බද්ධව ඇත
4. අපිභෞම ප්‍රරෝහණය දක්නට ඇත
5. එක් ඵලයක් තුළ බීජ කිහිපයක් ඇත.

20) වර්ධක ප්‍රචාරණය සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. මින් නිවැරදි වනුයේ

A - ඇතැම් ඒකබීජ පත්‍රී ශාක වර්ධක ප්‍රචාරණ ක්‍රම මගින් ප්‍රචාරණය කළහැක.
B - අතු බැඳීමේදී ශාක අත්තේ කැපුමට මදක් පහලින් C:N අනුපාතය වැඩිවීම නිසා මුල් හටගනී.
C - වර්ධක ප්‍රචාරණය ස්වාභාවිකව හා කෘතිමව සිදුවන අතර ප්‍රවේණිකව වෙනස් ශාක නිපදවයි.

1. A පමණි 2. B පමණි 3. C පමණි
4. A හා B පමණි 5. A හා C පමණි

Scanned with CamScanner

21) ද්වි ශෘහිතාව, අනුවර්තනයක් ලෙස සලකන්නේ

1. ස්ව පරාගනය සඳහාය
2. පර පරාගනය සඳහාය
3. වර්ධක ප්‍රචාරණය සඳහාය
4. විසංයෝගතාව සඳහාය
5. කෞමාරෝද්භවය සඳහාය

22) පටක රෝපණයේදී, භාවිතා කරන විදුරු භාණ්ඩ, පෝෂක මාධ්‍යය, අනවරත ප්‍රවාහ කුටීරය, තාප සංවේදී රසායනික ද්‍රව්‍ය පීවානුහරණයට යොදාගන්නා උපකරණ හා ද්‍රව්‍ය පිළිවෙළින් දැක්වෙන්නේ,

1. විදුලිඋදුන, පීඩන තාපකය, විෂබීජ නාශක සහ 70% ඇල්කොහොල්, පටලමය පෙරනය
2. පීඩන තාපකය, විදුලිඋදුන, පටලමය පෙරන, විෂබීජ නාශක සහ 70% ඇල්කොහොල්ය
3. විදුලිඋදුන, පීඩන තාපකය, පටලමය පෙරන, විෂබීජ නාශක සහ 70% ඇල්කොහොල්ය
4. විෂබීජ නාශක සහ 70% ඇල්කොහොල්, පීඩන තාපකය, පටලමය පෙරන, විදුලිඋදුනය
5. විදුලිඋදුන, විෂබීජ නාශක සහ 70% ඇල්කොහොල්, පටලමය පෙරන, පීඩන තාපකයය

23) ශාක නුමුහුම් පෙළ වරණයේදී සිදුකරන ක්‍රියාකාරකම් නිවැරදිව දැක්වෙන්නේ,

1. ශාකවලින් බීජ ලබාගැනීම ⟶ ස්ව පරාගනය ⟶ ගහනයකින් අවශ්‍ය ලක්ෂණ සහිත ශාක තේරීම
2. ස්ව පරාගනය ⟶ ශාකවලින් බීජ ලබාගැනීම ⟶ ගහනයකින් අවශ්‍ය ලක්ෂණ සහිත ශාක තේරීම
3. ගහනයකින් අවශ්‍ය ලක්ෂණ සහිත ශාක තේරීම ⟶ බීජ ලබාගැනීම ⟶ ස්ව පරාගනය
4. ගහනයකින් අවශ්‍ය ලක්ෂණ සහිත ශාක තේරීම ⟶ බීජ ලබාගැනීම ⟶ පර පරාගනය
5. පර පරාගනය ⟶ ශාකවලින් බීජ ලබාගැනීම ⟶ ගහනයකින් අවශ්‍ය ලක්ෂණ සහිත ශාක තේරීම

24) ශාක ප්‍රචාරක ව්‍යුහ කිහිපයක් පහත දැක්වේ

A - සරල ප්‍රචාරක ව්‍යුහ D - හරිතාගාර
B - උණුසුම් පාත්ති E - පොලිතින් උමං
C - ලැත්තිවාස

මේවායින් අර්ධ ස්ථිර ප්‍රචාරක ව්‍යුහ සඳහා උදාහරණ වන්නේ,

1. A හා B වේ 2. B හා C වේ 3. B හා D වේ 4. C හා E වේ 5. A හා C වේ

25) සංසරණය වන ජල රෝපිත වගා පද්ධතිවල ප්‍රධාන වාසිය වන්නේ,

1. බලශක්තිය අවශ්‍ය නොවීම
2. නඩත්තු වියදම අඩුවීම
3. පැල විශාල ප්‍රමාණයක් සිටුවිය හැකිවීම
4. අඩු පෝෂක ප්‍රමාණයක් අවශ්‍ය වීම
5. ඕනෑම කාලගුණික තත්ත්වයකට ඔරොත්තු දීම

26) බෝගයක දිලීර රෝග පාලනය කළ හැක්කේ,

1. හානි වූ බෝගයට වර්ධක යාමක යෙදීම මගින්
2. හානි වූ බෝගයට ප්‍රතිජීවකයක් ඉසීම මගින්
3. හානි වූ බෝගයට සින්ක් සල්පේට් යෙදීම මගින්
4. හානි වූ බෝගයට බෝර්ඩෝ (Bordeaux) මිශ්‍රණය ඉසීම මගින්
5. හානි වූ බෝගයට නිර්දේශිත කෘමි නාශයකයක් ඉසීම මගින්

27) බෝග මාරුව සැලකිය හැක්කේ

1. ශෂ්‍ය විද්‍යාත්මක පළිබෝධ පාලන ක්‍රමයක් ලෙස ය.
2. ජීව විද්‍යාත්මක පළිබෝධ පාලන ක්‍රමයක් ලෙස ය.
3. විලෝපිකයන් දිරිගැන්වීම මගින් පළිබෝධ පාලනය කරනු ලබන ක්‍රමයක් ලෙස ය.
4. පළිබෝධ පාලනයට යොදා ගන්නා බහුබෝග පද්ධතියක් ලෙස ය.
5. යාන්ත්‍රික පළිබෝධ පාලන ක්‍රමයක් ලෙස ය.

Scanned with CamScanner

28) පහත රූප සටහනේ දැක්වෙන පළිබෝධකයා අයත් වන කෘමි ගෝත්‍රය වනුයේ,



1. හෙමිප්ටෙරා ය.
2. කෝලියෝප්ටෙරා ය.
3. ලෙපිඩොප්ටෙරා ය.
4. ඩිප්ටෙරා ය.
5. හයිමොනොප්ටෙරා ය.

29) ගොවි මහතකු සතු ව ටැංකි ධාරිතාව ලීටර 17 ක් වූ නැප්සැක් දියර ඉසින යන්ත්‍රයක් ඇත. ඔහුගේ හෙක්ටයාර් එකක් වූ ක්ෂේත්‍රයේ වල් පැළ පාලනය සඳහා වල් නාශකය ලීටර් 1.7 යෙදීමට අවශ්‍යව ඇත. ඔහුගේ ක්ෂේත්‍රයට වල්නාශක මිශ්‍රණයෙන් ලීටර 170 ක් යොදන ලෙස කෘෂිකර්ම උපදේශකවරයා නිර්දේශ කර ඇත. එක් එක් ටැංකියක් සඳහා මිශ්‍ර කළ යුතු වල් නාශක ප්‍රමාණය වනුයේ

1. 0.17 *ml* 2. 1.7 *ml* 3. 17.0 *ml* 4. 170.0 *ml* 5. 1700 *ml*

30) බෝගයකට පළිබෝධ නාශක යෙදීමට වඩාත් සුදුසු අවධිය වනුයේ පළිබෝධ හානිය

1. වසංගත මට්ටමට පත්වීමෙන් පසුව ය.
2. ආර්ථික හානිදායක මට්ටමට පත්වීමෙන් පසුව ය.
3. ආර්ථික හානිදායක මට්ටමට ඉතා ආසන්න විටය.
4. ආර්ථික දේහලිය මට්ටමට පත්වීමට පෙරය.
5. ආර්ථික දේහලිය මට්ටමට පත්වීමෙන් පසුව ය.

31) ජාතික ආහාර සුරක්ෂිතතාවයට අදාල බලපෑමක් නොවන්නේ

1. සැකසූ ආහාර ප්‍රතිඅපනයනය කිරීමයි.
2. ආහාර බෝගවල පසු අස්වනු හානිය අඩු කිරීමයි.
3. සහල් මත පදනම් වූ විවිධාංගිකරණය කළ ආහාර නිෂ්පාදනයයි.
4. වැඩි අස්වනු ලබාදෙන ආහාර බෝග හඳුන්වාදීමයි.
5. ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීමට ක්‍රියාමාර්ග නොගැනීමයි.

32) වියළීම යනු ආහාර පරිරක්ෂණ ක්‍රමයකි. වියලූ ආහාර පරිරක්ෂණය සඳහා බලපාන ප්‍රධාන හේතුව වන්නේ

1. ආහාරයේ බර අඩුවීම නිසා ය
2. වියළීමේදී රත් කිරීම නිසා ය
3. ආහාරයේ ජල සක්‍රියතාව අඩුවීම ය
4. ගබඩා තුළ ඇති අඩු උෂ්ණත්වය නිසා ය
5. වියළීමේදී අධික උෂ්ණත්වය නිසා විෂබීජ විනාශවන නිසා ය.

33) ඇසුරුම් තුළ ඇති වායු පරිසරය වෙනස් කරමින් ඇසුරුම්කරනය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. ආහාරයක විටමින ප්‍රමාණය ආරක්ෂා කළ නොහැකිය
2. ප්‍රධාන අරමුණ වනුයේ පහළ උෂ්ණත්ව තත්ත්වයක් පවත්වා ගැනීමය
3. ආහාර ඔක්සිකරණය වලකනු ලැබීමය
4. ඇසුරුම්කරණ පිරිවැය අඩු කරනු ලැබීමය
5. ද්‍රවමය ආහාර වර්ග සඳහා පමණක් යෙදිය හැකි වීමය

34) නියමිත පරිණත අවධියේදී අස්වනු නෙළීමෙන්

1. අස්වැන්නේ ජීව කාලය වැඩි වේ.
2. ධාන්‍යවල බීජ හැලීම වැඩි වේ.
3. අස්වැන්නේ වර්ණය, ගන්ධය සහ ස්වාදය අඩුවේ.
4. ඇතැම් අස්වනුවල අන්තර්ගත තන්තු ප්‍රමාණය වැඩි වේ.
5. කරල් තුළ බීජ ප්‍රරෝහණයවීම වැඩි වේ.

35) ඇතැම් බෝගවල අස්වැන්න නෙළීම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ

A - දෙහි ඵල නෙළා ගැනීමට වඩාත් යෝග්‍ය වන්නේ උදෑසන කාලයයි.
B - පත්‍රමය එළවළුවල අස්වැන්න නෙළීමට වඩාත් යෝග්‍ය වන්නේ සන්ධ්‍යාවේ අවසානභාගයයි
C - අඹ ඵලයේ වෘන්තයේ කොටසක් ඉතිරිවන සේ අඹ අස්වනු නෙළීම වඩා යෝග්‍ය වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ,

1. A පමණි 2. B පමණි 3. C පමණි 4. A හා B පමණි 5. A හා C පමණි

Scanned with CamScanner

36) ගොවියෙක් ඔහුගේ මස්ජොක්කා වගා ක්ෂේත්‍රයට අස්වනු නෙලීමට පෙර දින ජල සම්පාදනය කරන ලදී. මෙය වඩාත් හොඳින් පැහැදිලි කළ හැක්කේ,

1. වාරි ජලය අපතේ යැවීමක් ලෙසය
2. නෙලන ලද අස්වැන්නේ සයනයිඩ් ප්‍රමාණය අඩු කිරීමට සිදු කළ පූර්ව අස්වනු ක්‍රියාකාරකමක් ලෙසය
3. නෙලන ලද අස්වැන්නේ නැවුම් බව පවත්වා ගැනීමට සිදු කළ පූර්ව අස්වනු ක්‍රියාකාරකමක් ලෙස ය
4. නෙලන ලද අස්වැන්නේ බර වැඩි කිරීමට සිදු කරන පූර්ව ක්‍රියාකාරකමක් ලෙසය
5. පසු අස්වනු හානි අවම කිරීමට සිදු කළ පූර්ව ක්‍රියාකාරකමක් ලෙස ය

37) බිත්තරයක ගුණාත්මක බව පරීක්ෂාවේදී යොදාගන්නා හැඩ දර්ශකය

1. $\frac{\text{බිත්තරයක දිග}}{\text{බිත්තරයක පළල}} \times 100$ යන සමීකරණය මගින් සෙවිය හැකිය
2. 84% කට ආසන්න අගයක් පැවතිම යෝග්‍යය
3. නිර්ණයට අවශ්‍ය බිත්තරයේ දිග හා පළල කැන්ඩ්ලින් උපකරණයෙන් සෙවිය හැකිය
4. මෙම දර්ශකය පාදක කරගනිමින් රක්කවීම සඳහා සුදුසු නුසුදුසු බිත්තර තීරණය කළ හැකිය
5. ඉහත ප්‍රකාශ හතරම නිවැරදි වේ.

38) කිරි ලබා ගැනීමට භාවිතා කරනු ලබන 'මී ගව' වර්ගයක් වනුයේ

1. ෆ්‍රිෂියන්
2. ජර්සි (Jersey)
3. නිලිරවි
4. ඔස්ට්‍රේලියානු මිල්කින් සිබු (AMZ)
5. රතු සින්දි

39) මෙම රූප සටහනේ 'X' ලෙස නම් කර ඇති ව්‍යුහයේ කාර්යය වනුයේ,



1. ඩිම්බය ශුක්‍රාණුවක් හා සංසේචනයට ඉඩ සැලසීමයි
2. කලලයට ආරක්ෂාව සැපයීමයි
3. ඩිම්බ නිපදවීමයි
4. කලලයට අධිරෝපනය හා පෝෂක සැපයීමයි
5. සංසර්ගයේදී ශුක්‍රාණු තැන්පත් කිරීමයි

40) ශ්‍රී ලංකාවේ කුකුල් පාලනය පිළිබඳ වගන්ති කිහිපයක් පහත දැක්වේ.

A - සියුම් ක්‍රමය මගින් කුකුළන් ඇති කිරීමේදී බහුලව ම භාවිතා වන්නේ ඝන ආස්තරන ක්‍රමය වේ.
B - කැබිනට් ආකාර බිත්තර රක්කවනයක් තුළ බිත්තරයේ මොට කෙලවර පහළට වනසේ සිරස්ව තබනු ලැබේ.
C - බෘඩරයක් සැකසීමේදී වෘත්තයක හැඩයට සැකසීමෙන් උපරිම ඉඩ ප්‍රමාණයක් ලබාගත හැකි වේ.

මින් සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ,

1. A පමණි
2. B පමණි
3. A හා C පමණි
4. B හා C පමණි
5. A, B හා C යන සියල්ලම

41) සත්ත්ව ආහාර අතරින් "තෙත් දළ" ආහාරයකි

1. පිදුරු
2. හේ
3. මාළු අත්තය
4. පොල් පුන්නක්කු
5. සයිලේජ්

42) ඝන ආස්තරන කුකුළු නිවාසයක බිම සඳහා වඩාත් යෝග්‍ය වන්නේ,

1. සුමට සිමෙන්ති බිමක්
2. සුමට මැටි බිමක්
3. රළු ගල් ඇතිරූ බිමක්
4. ගඩොල් ඇතිරූ බිමක්
5. ලෑලි වලින් තැනූ බිමක්

43) පහත දැක්වෙන්නේ කිරිවල මනිනු ලබන පරාමිති කිහිපයකි

A - මේද ප්‍රතිශතය
B - විශිෂ්ඨ ගුරුත්වය
C - මේද නොවන ඝන ද්‍රව්‍ය ප්‍රමාණය

ඉහත ඒවා අතුරෙන් ශ්‍රී ලංකාවේ කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානවලදී කිරිවල මිල තීරණය කරනු ලබන්නේ,

1. A මගින් පමණි
2. B මගින් පමණි
3. A හා B මගින් පමණි
4. A හා C මගින් පමණි
5. A, B හා C යන සියල්ලම මගිනි

Scanned with CamScanner

44) ව්‍යවසායකයෙකු සම්බන්ධයෙන් පහත දක්වා ඇති ප්‍රකාශ සලකන්න

A - නිෂ්පාදන සාධක නිසි පරිදි යොදාගැනීම
B - නවෝත්පාදන හැකියාවකින් යුක්තවීම
C - අන් අයගේ අදහස් අනුව තීරණ ගැනීම
D - වගකීම් දැරීම හා අවදානම් වලට මුහුණ දීමට හැකියාව තිබීම

ඉහත ප්‍රකාශ අතරින් සාර්ථක ව්‍යවසායකයකු සම්බන්ධයෙන් නිවැරදි වන්නේ,

1. A, B හා C පමණි
2. A, B හා D පමණි
3. A, C හා D පමණි
4. B, C හා D පමණි
5. C හා D පමණි

45) ව්‍යාපාරයකට මග පෙන්වන සිතියමක් වන ව්‍යාපාර සැලැස්ම පිළිබඳව වගන්ති කිහිපයක් පහත දැක්වේ. ඒවායින් නිවැරදි වන්නේ,

1. හොඳ ව්‍යාපාර සැලැස්මක් එකවර සැකසිය හැකි අතර එය විවිධ අවස්ථාවන්හිදී වෙනස්කම්වලට ලක්කරනු නොලැබේ.
2. මෙය සකස් කිරීම හෝ නොකිරීම ව්‍යාපාරයේ ස්වභාවය හෝ ප්‍රමාණය මත තීරණය කළ හැකිය.
3. ව්‍යාපාර සැලැස්මේ සෙසු කොටස්වල ඇති වැදගත් කරුණු පමණක් විධායක සාරාංශයේ ඇතුළත් වේ.
4. වෙළඳපොළ හෝ කර්මාන්ත විශ්ලේෂණය යටතේ ව්‍යාපාරයේ මෙහෙවර හා දැක්ම අඩංගු කළ යුතුය.
5. ව්‍යාපාර සැලැස්මක් සකස්කිරීමේ ප්‍රධාන අරමුණු වන්නේ ණය ලබා ගැනීමයි.

46) නිෂ්පාදන ශ්‍රිතයක නිෂ්පාදන කලාප පහත ප්‍රස්ථාරයේ දක්වා ඇත. ඒ අනුව වඩා නිරවද්‍ය පිළිතුර වනුයේ,



1. හීනවන ඵල ලැබීම II අවදිය තුළදී මුලින්ම ආරම්භ වේ
2. නිෂ්පාදකයා සෑම විටම උත්සාහ කරනුයේ III අවදිය වෙතට යාමටය
3. II වන අවදියෙන් ඔබ්බට තව දුරටත් විචල්‍ය යෙදවුම් වැඩි කිරීම ඵලදායි නොවේ.
4. II වන නිෂ්පාදන අවදියේදී මුළු නිෂ්පාදනය උපරිමයට ලඟාවී නොමැති අතර ආන්තික නිෂ්පාදනය ඍන අගයක පවතී.
5. I වන නිෂ්පාදන අවදියේ මුල් කාලයේදී මුළු නිෂ්පාදනය අඩු වන වේගයකින් වැඩි වී පසුව වැඩි වන වේගයකින් වැඩිවේ.

47) "ප්‍රාග්ධනය" යන නිෂ්පාදන සාධකයේ ලක්ෂණයක් නොවන්නේ,

1. කෙටි කාලීන වීම
2. මිනිසා විසින් නිර්මිත වී තිබීම
3. ක්ෂය වීමට භාජනය වීම
4. ඵලදායිතාවයෙන් යුතු වීම
5. නිෂ්පාදන ක්‍රියාවලි ගණනාවකට යොදාගත හැකි වීම

48) "මී උණ" රෝගයේ රෝග ලක්ෂණයක් නොවන්නේ,

1. හිසරදය
2. මස්පිඬු වේදනාව
3. උණ
4. මෙනින්ජයිටිස්
5. උදරයේ වේදනාව

49) කාබනික ගොවිතැනට පදනම් වන මූලධර්මයක් නොවන්නේ,

1. සෞඛ්‍ය
2. ආර්ථික මූලධර්ම
3. පරිසර විද්‍යාත්මක මූලධර්ම
4. සාධාරණත්වය
5. සැලකිලිමත් බව

50) තිරසාර කෘෂිකර්මාන්තයේ ප්‍රධාන අරමුණ වන්නේ,

1. පාංශු සෞඛ්‍යය පවත්වා ගැනීම
2. පාංශු හා ජල සංරක්ෂණය කිරීම
3. පාරිසරික සෞඛ්‍යය ආරක්ෂා කිරීම
4. ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම
5. අනාගතය සඳහා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීම

Scanned with CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

13 ශ්‍රේණිය - තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - Grade 13 - 2025

කෘෂි විද්‍යාව II
Agri Science II

08 S II

පැය තුනයි
Three Hours

අමතර කියවීම් කාලය විනාඩි 10 යි.

නම / විභාග අංකය: ....

උපදෙස් :
- මෙම ප්‍රශ්න පත්‍රය පිටු 10 කින් සහ ප්‍රශ්න 10කින් සමන්විත වේ.
- මෙම ප්‍රශ්න පත්‍රයේ A හා B ලෙස කොටස් දෙකකින් සමන්විත වන අතර කොටස් දෙකටම නියමිත කාලය පැය තුනකි.

A කොටස - ව්‍යුහගත රචනා
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.
- ඔබේ පිළිතුරු ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන් වල ලිවිය යුතුය. මෙම ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද, දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බව ද, සලකන්න.

B කොටස - රචනා
- ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
- මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න. සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු A හා B කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ කොටස උඩින් තිබෙන පරිදි අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.
- ප්‍රශ්න පත්‍රයේ B කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙනයාමට ඔබට අවස්ථාව ඇත.

A කොටස - ව්‍යුහගත රචනා

01) A. (i) කෘෂිකර්මාන්තය යනු ආහාර සඳහා හෝ වෙනත් අවශ්‍යතාවක් සඳහා බෝග වගා කිරීමේ හා සත්ත්ව පාලනයේ යෙදීමේ කලාවක් හා විද්‍යාවකි.

වර්තමාන කෘෂි ක්ෂේත්‍රය මුහුණ පා ඇති අභියෝග 02ක් සඳහන් කරන්න.

1. ....
2. ....

(ii) කෘෂිකර්මාන්තය හා සම්බන්ධ අණ පනත් 02ක් නම් කරන්න.

1. ....
2. ....

B. (i) කෘෂිකර්මාන්තයට අදාළ කාලගුණික තොරතුරු ලබා ගැනීමට උපකරණ පිහිටුවා ඇති ස්ථානයක් කෘෂි කාලගුණික ඒකකයක් ලෙස හඳුන්වයි. කෘෂි කාලගුණික ඒකකයක් හා කාලගුණික ඒකකයක් අතර වෙනස්කම් 02ක් සඳහන් කරන්න.

1. ....
2. ....

Scanned with CamScanner

(ii) කෘෂි කාලගුණික මධ්‍යස්ථානයක දැකිය හැකි පහත උපකරණ ඇසුරින් පිළිතුරු සපයන්න.

A



B

C

	උපකරණය	මැනෙන පරාමිතිය	ඒකකය
A	....	....	....
B	....	....	....
C	....	....	....

C. (i) පස තුල ඇති ජලය පාංශු ජලය ලෙස හඳුන්වන අතර විවිධ පාංශු ජල මට්ටම් දැක්වෙන පහත සටහනේ A, B, C, D ජල මට්ටම් නම් කරන්න.



1. A - ....

2. B - ....

3. C - ....

4. D - ....

(ii) පසෙහි පහත ලක්ෂණ මනිනු ලබන ඒකකය සඳහන් කරන්න.

(a) කැටායන හුවමාරු ධාරිතාව ....

(b) දෘශ්‍ය ඝනත්වය ....

ALapiedu.com

Scanned with CamScanner

D. (i) ශාක පෝෂක ඌනතා සම්බන්ධ පහත සටහන සම්පූර්ණ කරන්න.

පෝෂක ඌනතාවය

පරිණත පත්‍ර වල හරිතක්ෂය	2)	ළපටි පත්‍ර පළමුව වක්‍ර වීම අග්‍රස්ථය ඇඹරී විකෘති වීම	4) ....
↓	↓	↓	↓
1) .... ඌනතාවය	Mg ඌනතාවය	3) .... ඌනතාවය	P ඌනතාවය

E. (i) වී බෝගය සඳහා නයිට්‍රජන් අවශ්‍යතාවය 207kg/hac වේ. ඔහුගේ ක්ෂේත්‍රයේ ඇති ලබාගත හැකි නයිට්‍රජන් ප්‍රමාණය 115kg/hac වේ. නයිට්‍රජන් වල පොහොර කාර්යක්ෂමතාව 50% ලෙස උපකල්පනය කර ඔහුගේ ක්ෂේත්‍රයට යෙදිය යුතු නයිට්‍රජන් ප්‍රමාණය ගණනය කරන්න.

....

....

....

....

(ii) නයිට්‍රජන් පොහොර ලෙස යූරියා යොදන්නේ නම් යෙදිය යුතු යූරියා ප්‍රමාණය ගණනය කරන්න. (යූරියා වල N - 46%)

....

....

....

F. (i) ක්ෂේත්‍රයේ බීජ හෝ පැල සිටුවා ඒවා ප්‍රරෝහණය වී බෝගයක් ලෙස වැඩීමට සැලැස්වීම බෝග සංස්ථාපනයයි. ප්‍රධාන බෝග සංස්ථාපන ක්‍රම 02 ක් නම් කරන්න.

1. ....
2. ....

(ii) පහත සඳහන් දේශගුණික කලාපය සඳහා යෝග්‍ය තවාන් වර්ගය සඳහන් කරන්න.

දේශගුණික කලාපය	යෝග්‍ය තවාන් ආකාරය
1. තෙත් කලාපය	....
2. වියළි කලාපය	....

G. (i) පාලනය කරනලද පෘෂ්ඨීය ජල සම්පාදන ක්‍රම 03 ක් නම් කරන්න.

1. ....
2. ....
3. ....

(ii) බෝගයක ශුද්ධ ජල සම්පාදන අවශ්‍යතාවය 9cm හා ජල සම්පාදන කාර්යක්ෂමතාව 60% නම් දළ ජල සම්පාදන අවශ්‍යතාවය ගණනය කරන්න.

....

....

Scanned with CamScanner

02) A. සෛල විභාජනය හා සෛල විශාල වීම නිසා ශාකයක ප්‍රමාණයෙහි පරිමාවෙහි හා බරෙහි සිදුවන අප්‍රත්‍යාවර්ති වැඩිවීම ශාක වර්ධනයයි.

(i) ශාක වල වර්ධනය මැනීමට යොදාගත හැකි වර්ධන පරාමිති 02 ක් නම් කරන්න.

1. ....

2. ....

(ii) දර්ශීය වර්ධන වක්‍රය පහත දී ඇති අක්ෂ මත ඇඳ පෙන්වන්න.

(iii) බෝග වර්ධන වේගය (CGR) අර්ථ දක්වන්න

....

....

(iv) පත්‍ර ක්ෂේත්‍රඵල දර්ශකය (LAI) සෙවීම සඳහා සුදුසු සමීකරණයක් ලියන්න.

....

....

....

B. බීජයක් යනු කලලයක් හා එහි ආවරණ වලින් සමන්විත පරිණත සංසේචිත ඩිම්බයකි.

(i) බීජ ප්‍රරෝහනය අර්ථ දක්වන්න.

....

....

(ii) බීජ ප්‍රරෝහන ක්‍රියාවලියේ අනුපිළිවෙල දැක්වෙන පහත සටහන සම්පූර්ණ කරන්න.

A - බීජයට නිපානය මගින් ජලය ඇතුල්වීම

↓

B - (i) ....

↓

C - වර්ධනය ආරම්භ වීම

↓

D - (ii) ....

↓

E - (iii) ....

Scanned with CamScanner

(iii) බීජ සුප්තතාවයේ වැදගත්කම් 02ක් සඳහන් කරන්න.

1. ....

2. ....

(iv) පහත බීජවල සුප්තතාවය ඉවත් කිරීමට සුදුසු ක්‍රම සඳහන් කරන්න.

බීජ වර්ගය	සුප්තතාවය ඉවත් කරන ක්‍රමය
(a) කරවිල	....
(b) අඹ	....
(c) දඹල	....
(d) තේක්ක	....

(v) රෝපණ ද්‍රව්‍ය ලෙස යොදාගන්නා වී බීජ, බිත්තර වී ලෙස හඳුන්වන අතර බිත්තර වී සඳහා බීජ සහතික කිරීමේ සේවයේ පර්යේෂනාගාර ප්‍රමිති සඳහන් කරන්න.

(a) ප්‍රරෝහණ ප්‍රතිශතය ....

(b) වල් බීජ ....

(c) තෙතමන ප්‍රතිශතය ....

(d) වෙනත් බීජ ....

C. බෝග නිෂ්පාදන ඉලක්ක ලඟාකරගැනීමට ශාක අභිජනනය ඉතා ප්‍රයෝජනවත්ය

(i) ශාක අභිජනනයේ අරමුණු 02ක් සඳහන් කරන්න.

1. ....

2. ....

(ii) ශාක අභිජනනය සඳහා යොදා ගන්නා මූලික ක්‍රම 4ක් නම් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

(iii) ජාන සම්පත් හායනයට බලපාන හේතු 02ක් සඳහන් කරන්න.

a. ....

b. ....

D. බෝග වගාවේදී පරිසර තත්ත්ව පාලනයට ආරක්ෂිත ව්‍යුහ යොදා ගනියි. පහත එක් එක් ආරක්ෂිත ව්‍යුහ සඳහා උදාහරණයක් බැගින් සඳහන් කරන්න.

(i) තාවකාලික ආරක්ෂිත ව්‍යුහ - ....

(ii) අර්ධ ස්ථිර ආරක්ෂිත ව්‍යුහ - ....

(iii) ස්ථිර ආරක්ෂිත ව්‍යුහ -. ....

E. පස් රහිතව සිදු කරන වගාව නිර්පාංශු වගාව ලෙස හඳුන්වයි.

(i) නිර්පාංශු වගාව සඳහා යොදා ගන්නා මාධ්‍යයක් සතුවිය යුතු ගුණාංග 03ක් සඳහන් කරන්න.

(a) ....

(b) ....

(c) ....

Scanned with CamScanner

03) A. කෘෂිකාර්මික වගාභූමිවල ප්‍රධාන ගැටළුවක් වන්නේ වල් පැළ වර්ධනය වීමයි

(i) වල් පැලෑටියක් යනු කුමක්ද?

....

....

....

(ii) රූපාකරය අනුව භෞමික වල් පැලෑටි වර්ග කර ඒ එක එකක් සඳහා උදාහරණය බැගින් දෙන්න

....

....

....

(iii) වල් පැළ පාලනය පිළිබඳ නවීන ක්‍රම වලදී වල් පැළ ප්‍රයෝජනවත් ලෙස භාවිතා කිරීම සාර්ථක වල් පැල පාලන ක්‍රමයක් ලෙස සැලකේ. වල් පැළ වල විවිධ භාවිත 3ක් ලැයිස්තුගත කරන්න. එක එකක් සඳහා උදාහරණය බැගින් දෙන්න.

....

....

....

B. ශ්‍රී ලංකාව තුළ නිපදවන ආහාරවලින් තුනෙන් එකකට ආසන්න ප්‍රමාණයක් නරක් වීම නිසා අපතේ යයි. නිසි පරිරක්ෂණ ක්‍රම අනුගමනය කිරීමෙන් එම ප්‍රමාණය අඩු කළ හැකිය.

(i) ආහාර නරක් වීම යනු කුමක්ද?

....

....

(ii) ආහාර නරක් වීමට බලපාන භෞතික සාධක දෙකක් සඳහන් කරන්න.

1. ....

2. ....

(iii) සාම්ප්‍රදායික ආහාර පරිරක්ෂණ ක්‍රම දෙකක් නම්කර එම පරිරක්ෂණ ක්‍රමවල මූලධර්මය සඳහන් කරන්න.

	සාම්ප්‍රදායික පරිරක්ෂණ ක්‍රමය	මූලධර්මය
1.	....	....
2.	....	....

C. පසු අස්වනු හානි වලට බලපාන ප්‍රධාන සාධකයක් වන්නේ පෙර අස්වනු හානියයි.

(i) පෙර අස්වනු හානිය යනු කුමක්ද?

....

....

(ii) වී වගාවේදී පෙර අස්වනු හානි සිදුවිය හැකි ආකාර දෙකක් සඳහන් කරන්න.

1. ....

2. ....

(iii) එම හානි වලක්වා ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග දෙකක් සඳහන් කරන්න.

1. ....

2. ....

Scanned with CamScanner

D. කෘෂිකර්මාන්තයේ නියැලෙන පුද්ගලයින්ට එහිදී සිදු විය හැකි ආපදා රාශියකි.

(i) කෘෂිකාර්මික ආපදාවක් යන්න හඳුන්වන්න.

....

....

(ii) කෘෂි ක්ෂේත්‍රයේ ආපදා වැඩි වීමට හේතු දෙකක් සඳහන් කරන්න.

....

....

(iii) කෘෂිකර්මාන්තය ආශ්‍රිත බහුල සංක්‍රමණික රෝග දෙකක් සඳහන් කරන්න.

....

....

E. වර්තමාන කෘෂිකර්මාන්තයේදී අස්වනු අඩු වීම කෙරෙහි දේශගුණික විපර්යාස දැඩි බලපෑමක් ඇති කරයි.

(i) දේශගුණික විපර්යාස හඳුන්වන්න.

....

....

(ii) දේශගුණ විපර්යාස ඇති වීමට ප්‍රධාන හේතුව කුමක්ද?

....

....

(iii) ගෝලීය උණුසුම වැඩි වීමට බලපාන හේතු දෙකක් සඳහන් කරන්න.

....

....

04) A. තක්කාලි නිෂ්පාදන ක්‍රියාවලියක නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන පොහොර මිශ්‍රණ කිලෝග්‍රෑම් ගණන වැඩි කිරීමත් සමග තක්කාලි නිෂ්පාදනය වෙනස්වන ආකාරය පහත ප්‍රස්ථාරයේ දක්වා ඇත.



(i) A, B හා C වක්‍ර නම් කරන්න.

A .... B ....

C ....

(ii) C වක්‍රය සෘණ අගයක් ගැනීමෙන් පැහැදිලි වන න්‍යාය කුමක්ද?

....

Scanned with CamScanner

(iii) තක්කාලි කිලෝග්‍රෑම් 1ක මිල රුපියල් 100ක් වූයේ නම් නිෂ්පාදනය උපරිම වන අවස්ථාවේ ලැබෙන ආදායම කොපමණ ද?

....

....

(iv) පොහොර කිලෝග්‍රෑම් 1ක මිල රුපියල් 350 ක් වූයේ නම් එම අවස්ථාවේදී පොහොර සඳහා වැය වූ පිරිවැය කොපමණද?

....

....

B. (i) තක්කාලි වල මිල සමග ඉල්ලුම් ප්‍රමාණය අතර ප්‍රස්ථාරය ඇඳ එය D ලෙස නම් කරන්න.

(ii) තක්කාලි සඳහා පාරිභෝගික රුචිකත්වය ඉහල ගිය අවස්ථාවකදී තක්කාලි ඉල්ලුම වෙනස්වන ආකාරය ප්‍රස්ථාරයක් මගින් දක්වන්න. එය D_1 ලෙස නම්කරන්න.

(iii) තක්කාලි සැපයුම කෙරෙහි බලාන සාධක දෙකක් ලියන්න.

1. ....

2. ....

C. රූප සටහනේ දැක්වෙන්නේ එළදෙනකගේ ක්ෂීරණ පද්ධතියේ කොටසකි



(i) රූපසටහනේ A සිට E දක්වා කොටස් නම් කරන්න.

A .... B ....

C .... D ....

E ....

Scanned with CamScanner

(ii) අතින් කිරිදෙවීමේ ක්‍රම මොනවාද?

A .... B ....

C ....

(iii) කිරිදෙවීමේ ක්‍රම කිරිවල සංයුතියට බලපාන්නේ කෙසේද?

....

....

(iv) වැඩි කිරි ප්‍රමාණයක් ලබාගැනීම සඳහා අතින් කිරිදෙවීමේදී අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

1. ....

2. ....

D. පහත ප්‍රකාශවල සත්‍ය/අසත්‍ය බව සඳහන් කරන්න.

(i) ඉහල බිත්තර ප්‍රමාණයක් දමන සතුන්ගේ කෙන්ඩා හා හොටයේ වර්ණක විරංජනය වී යාම අඩු ය. (   )

(ii) කුකුළු පැටවුන් සඳහා දින 7කදී මරෙක්ස් එන්නත ලබාදීම සිදුවේ. (   )

(iii) වර්ධන අවදියේ කිකිළියන් සඳහා වර්ධන සලාකය සීමා කිරීමකින් තොරව ලබා දේ (   )

(iv) බ්‍රොයිලර් සතුන්ගේ ආහාර පරිවර්ථන අනුපාතය 1.8 ට අඩුවිය යුතුය (   )

(v) කොක්සිඩියෝසිස් රෝගය ඉන්කියුබේටර හරහා කුකුළු පැටවුනට බෝවීමේ අවධානමක් පවතී. (   )

E. උඩරට ගෙවතු වගාව මැදරට අතරමැදි කලාපයේ හමුවන බහු ස්ථරීය බෝග වගා පද්ධතියකි.

(i) උඩරට ගෙවතු වගාවට සුවිශේෂී වන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

1. ....

2. ....

(ii) උඩරට ගෙවතු වගාවේ පාරිසරික වැදගත්කම් දෙකක් ලියන්න.

1. ....

2. ....

(iii) උඩරට ගෙවතු වගාවේ ආර්ථික වැදගත්කම් දෙකක් ලියන්න.

1. ....

2. ....

Scanned with CamScanner

B කොටස - රචනා

05) i. කෘෂිකාර්මික අංශය නගා සිටුවීමට රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග විස්තර කරන්න.

ii. සහල් ඉල්ලුමට හා සැපයුමට බලපාන සාධක විස්තර කරන්න.

iii. කෘෂි කාලගුණික ඒකකයක් තුළ උපකරණ ස්ථාපනය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු විස්තර කරන්න.

06) i. පාංශු සෞඛ්‍යය හා ගුණාත්මක බව වැඩි දියුණු කිරීමට යොදාගත හැකි පාංශු පුනරුත්ථාපන ක්‍රම විස්තර කරන්න.

ii. පලිබෝධ වසංගත තත්ත්ව ඇතිවීමට බලපාන හේතු විස්තර කරන්න.

iii. පාලිත තත්ත්ව යටතේ බෝග වගාවේ ගැටළු විස්තර කරන්න.

07) i. පූර්ණ තාරගකාරී වෙළඳපොළ හා ඒකාධිකාරී වෙළඳපොළ අතර පවතින වෙනස්කම් සන්සන්දනය කරන්න.

ii. සත්ත්ව රෝග වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න.

iii. ක්ෂුද්‍ර ප්‍රචාරණ ක්‍රියාවලියේ පියවර විස්තර කරන්න.

08) i. බෝග වගාවේදී යොදාගන්නා විශේෂිත තවාන් වර්ග විස්තර කරන්න.

ii. ආහාර රටාව වෙනස්වීම නිසා ඇති වී ඇති පෝෂණ ගැටළු විස්තර කරන්න.

iii. ශාක වර්ධක යාමකවල කෘෂිකාර්මික භාවිතයන් විස්තර කරන්න.

09) i. අක්‍රමවත් ජල කළමනාකරණයේ ගැටලු විස්තර කරන්න.

ii. පොහොර භාවිත කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න.

iii. බ්‍රොයිලර් සතුන් පාලනයේදී සැලකිලිමත් විය යුතු කරුණු විස්තර කරන්න.

10) i. මිශ්‍ර බෝග වගාව ආහාර සුරක්ෂිතතාවයට බලපාන ආකාරය විස්තර කරන්න.

ii. කෘෂිකර්මාන්තයේ නියැලීමේදී ඇතිවන මානසික ආතතිය සඳහා හේතු විස්තර කරන්න.

iii. කෘත්‍රිම සිංචන ක්‍රියාවලිය විස්තර කරන්න.

ALapiedu.com

Scanned with CamScanner